# යුද්ධයෙන් පසු ශ්‍රී ලංකාව තුළ අඳුරු සංචරණය ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවය

එච් එම් කේ රංසි කරුණාරත්න*

පසුගිය දශක 30 තුළ වාර්ගික අර්බුධය හේතුවෙන් ශ්‍රී ලංකාව ඉතා විශාල ලෙස ලොව පුරා ප්‍රචලිත විය. මේ තත්ත්වය මත ලොව පුරා විසිර සිටින අඳුරු සංචරණ නැමියාවන් සහිත සංචාරකයන්ගේ ආකර්ෂණය නොමඳව ශ්‍රී ලංකාවට යොමු විය. යුද්ධය නිමාවීමෙන් පසු වසරේ ඉතා විශාල සංචාරකයන් සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවට පැමිණුනි. මෙම සංචාරකයන් අතරින් වෘත්තිමය ලැදියාවන් සහිතව සංචරණයේ යෙදෙන බොහෝ සංචාරකයන් ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර හා සුනාමියෙන් විනාශයට පත් වූ කලාපවල ස්මාරක හා සුසාන භූමි නැරඹීමට විශේෂ රුචිකත්වයක් දක්වූහ. ( උදා. සුනාමි ස්මාරකය යාල, පුදුකුඩුඉරිප්පු, කිලිනොච්චි, ෆාරා 3, එලිෆන්ට් පාස් ). මේ අනුව සුනාමියෙන් හා යුද්ධයෙන් පසු ශ්‍රී ලංකාව තුල අඳුරු සංචරණය ප්‍රචලිත කරන්නේ කෙසේද? යන්න විමසීම මෙම අධ්‍යයනයේ මුඛ්‍ය අරමුණ මෙන්ම පර්යේෂණ ගැටලුවද විය. ඊට අමතරව ශ්‍රී ලංකාව තුළ ප්‍රචලිත කළ හැකි අඳුරු සංචරණ ගමනාන්ත මොනවාද? අඳුරු සංචරණය ශ්‍රී ලංකාව තුල ප්‍රචලිත කිරීමට ඇති බාධා මොනවාද? සහ එම බාධා මගහැරීමට යොදගත හැකි උපක්‍රම මොනවාද? ඒ සඳහා සකස් කළ හැකි විධිමත්ම හා වඩාත් කාලීනම සංවර්ධන සැලැස්මක් ගොඩනගන්නේ කෙසේද? යන්න පරීක්ෂා කිරීම සඳහා ද විශේෂ අවධානයක් යොමුකර ඇත.

වර්තමානය වන විට යුද්ධයෙන් පශ්චාත් කාලීන ශ්‍රී ලංකාව තුළ අඳුරු සංචරණය යන සංකල්පය පෝෂණය කිරීමට ඉතාමත් හොඳ වටපිටාවක් තිබියදී පවා මේ පිළිබඳ රුචිකත්වයක් දක්වන දේශීය විදේශීය සංචාරකයන් සුළුතරයේ ගමනාන්ත අරමුණු පිළිබඳ නොසලකා හැර තිබෙන බව මෙහිදී එළඹී උපකල්පනය විය. සුනාමියට හා යුද්ධයට ගොදුරු වූ ඇතැම් ප්‍රදේශවල යුද්ධයක් පැවතී බවට සලකුනුකුදු හෝ නොමැති අතර යුධ ශේෂයන් (Memorial) ස්මාරක හා සුසාන භූමි ඉවත් කර රාජ්‍ය පාර්ශවයේ ජයග්‍රහණ පිළිබඳව කියවෙන ගොඩනැගීම් හා ස්මාරක පමණක් ඉදිකර ඇති බව දැකගත හැක. මෙම පර්යේෂණ අධ්‍යයනය සඳහා පර්යේෂණ ක්ෂේත්‍රය ලෙස 2004-2016 දක්වා කාලය ගැන අවධානය යොමු කරන ලදී. අධ්‍යයන ක්‍රමවේදය ලෙස සම්මුඛ සාකච්චා හා ප්‍රශ්නාවලි ප්‍රාථමික මූලාශ්‍ර ලෙස යොදාගන්නා ලදී. ද්විතීයික මූලාශ්‍ර ලෙස ශ්‍රී ලංකා සංචාරක මණ්ඩල වාර්තා, යුධ කාලීන රාජ්‍ය නොවන සංවිධාන වාර්තා, වෙබ් අඩවි අධ්‍යයනය සිදුකරන ලදී. සමස්ත පර්යේෂණයෙහි අධ්‍යයනයන් ඔස්සේ එළඹී නිගමනය වන්නේ සුනාමිය ආශ්‍රිත ස්මාරක නැරඹීමට සාපේක්ෂව යුද්ධය ආශ්‍රිත සැමරුම් විමසීමට විදේශීය සංචාරකයන් වැඩි උනන්දුවක් දක්වන බව හා ඒ සඳහා විධිමත් හා කාලීන සංවර්ධන සැලැස්මක් අත්‍යවශ්‍යය බවයි.

ප්‍රමුඛ පද - අඳුරු සංචරණය, සුනාමිය, යුද්ධය, ස්මාරක

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.